# කවිය

කවිය යනු කුමක්දැයි හඳුනා ගැනීම රස යනු කුමැක්දැයි හඳුනා ගැනීම හා සමානය . තවත් අයුරකින් කවිය යනු කුමක්දැයි හඳුනාගැනීම සත්‍යය යනු කුමක්දැයි වටහා ගැනීම තරම්ම සංකීර්ණ වූවකි.එම නිසාවෙන් ම විවිධ පුද්ගලයෙන් "කවිය" යන්නට අතීතයේ සිටම මේ දක්වා විවිධ අදහස් ඉදිරිපත් කොට ඇත. මානව ශිෂ්ටාචාරයේ උත්තම කලා මාධ්‍යයක් වූ කවිය පිළිබඳව ඉදිරිපත්ව ඇති නිර්වචන කිහිපයක් අපි මෙසේ හැඳින ගනිමු.

- "රමණීය අර්ථ මතු කෙරෙන ශබ්දය කවිය වේ." (ජගත්නාථ)
- "කවිය වනාහි හොඳම වචන හොඳම පිළිවෙළට යෙදීම වේ." (එස්.ටී.කොලිජ්)
- "රසය ආත්මය කොටගත් වැකිය කවිය වේ." (විශ්වනාථ)
- "අභ්‍යන්තර ගුණ සමුදායකින් විශිෂ්ටත්වයට පත් වූ රචනාව කවිය වේ." (ඇරිස්ටෝටල්)
- "කවිය යනු අනුත්සාහකව ගලා එන ප්‍රබල හැඟීම ය." (විලියම් වර්ඩ්ස්වින්)
- " කවිය තුල සිද්ධ වන්නේ මම අපි බවට පත්වීමයි." (පරාක්‍රම කොඩිතුවක්කු)
- "කවිය යනු ස්මරණීය වාගාලාපයයි." (ඩබ්.එච්.ඕඩන්)
- "ශබ්දයේ හා අර්ථයේ මනා සංකලනය කවිය වේ." ( භාමහ)
- "එක්තැන් වූ ශබ්දය හා අර්ථය කවිය වේ." (රුද්‍රට)
- "වචනාර්ථ, වාක්‍යඅර්ථ, ධ්වනිතාර්ථ ද ඉක්මවන චමත්කාරයක් හොඳ කාව්‍යයක සමුදයාර්ථයෙහි ඇත." (මාර්ටින් වික්‍රමසිංහ)
- "රස ඇති වැකියම යැ - කව් නමින් ගැනෙනුයේ<br>රස නැති විරිත් වැකි - ගැමි වහර කව් නම් යැ" (කුමාරතුංග මුනිදාස)

- උක්ත අදහස් දෙස අවධානය යොමු කරන කල්හී අපට හැගෙනුයේ "කවිය යනු අපට නැතුවම බැරි දෙයක් යන්නයි" හොඳ කවියක් කියවන සහෘදයාගේ සිතට, එය හිතට කා වැදුනු දා පටන් අමරණීය රිදීමක් ලද්දා සේ දැනෙයි. කෙසේ වුව ද කවිය පිළිබඳව අධ්‍යනය කිරීමේ දී එහි ලක්ෂණ හැඳින ගැනීම වැදගත් වේ.

## ❖ අන්තර්ගතය

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

අත්දැකීම් නිර්මාණයක් සාර්ථක වීමට බෙහෙවින් වැදගත් වේ. රචකයෙකු අත්දැකීම් ප්‍රධාන අකාර 04කින් ලබයි. එනම්,

01. දැකීමෙන් ලබන අත්දැකීම .
02. දීමෙන් ලබන අත්දැකීම .
03. කියවීමෙන් ලබන අත්දැකීම.
04. භෞතික වශයෙන් ලබන අත්දැකීම.

කවියකු තමන් ලබන අත්දැකීම ප්‍රතිනිර්මාණය කරයි.(නැවත නිර්මාණය කරයි.) එවිට පුද්ගලානුභූතිය, කාවනුභූතියක් බවට පත් වේ. එලෙස කවියා ලබන අත්දැකීම් අපූර්වත්වයෙන් ඉදිරිපත්කල යුතු ය. එවිට නිර්මාණයේ චමත්කාරය රසිකයාගේ සිත තුළ නැවත නැවත දෝංකාරය නංවයි. එමෙන්ම අත්දැකීම අපූර්වත්වයෙන් විය යුතු අතර අර්ථාන්විත විය යුතු ය. එවිට රසිකයා තම ජීවිතය පුනරාවලෝකනය කිරීමට පෙළඹෙයි.

### පොඩි දුව - මොනිකා රුවන්පතිරණ

පවුලේ බර අඩු කරන්න ගෙදරින් පිට වන්නට පෙර
මතකද අම්මේ උඹ මට ඇමතුවේ පොඩි දුවේ කියල
ජීවිතයේ පළමුවරට තනි වුණු කල ඈත රටක
එහි මිනිසුන් හුග දෙනෙක්ම මට කිව්වේ ලිසී කියල

අතින් හිසින් බර උසුලන් පාර දිගේ මං යනකොට
දකින කෙනෙක් මට කිව්වේ ඒ වැඩකාරියක් කියල
පොඩි දරුවෙකු අතින් අරන් පාසැලකට මං යනකොට
එතන හිඳින අය කීව්වේ බේබිගෙ ආයම්ම කියල

කෑම බීම උයා පිහා මං දරදිය අදින කලට
දකින සියලු දෙනා කිව්වේ ගෙදර කුස්සි අම්ම කියල
ඒත් අම්මෙ දවස ගෙවිල නිදි පැදුරේ ඇල වුණාම
තවමත් සිහිනෙන් උඹ මට කියන්නෙ පොඩි දුවේ කියල

කවියකු ලබා දෙන අත්දැකීම පිළිබඳව "මාර්ටින් වික්‍රමසිංහ" මහතා තම මතය මෙලෙස රසවත් ලෙස ඉදිරිපත් කරයි.

" ලෝකයේ කිසිදු කලා කෘතියක් අත්දැකීමෙන් තොරව නිර්මාණය වී නැත. කලාත්මක නිපදවීම ද දරුවකු වැදීම වැන්න. කලාකරුවාගේ හිසහි පිළිසඳගත් වස්තු බීජය වැඩී ක්‍රමයෙන් මෝරන්නේ දරුවෙක් වැඩී මෝරන්නාක් මෙනි. මේරූ බීජය වචනයට නැගීම, තිරපටට නැගීම යන මේ කවරක් වුව ද බෙහෙවින් සමාන වන්නේ දරුවෙකු වැදීමේ කාර්යයට යැයි සිතමි."

### ❖ භාෂාව

කවියකුගේ අත්දැකීම ප්‍රකාශ කෙරෙන්නේ භාෂව මගිනි. කවියකු භාෂව මගින් උත්සාහ කරනුයේ තම අත්දැකීම පාඨකයාගේ සිත තුළ ධ්වනිපූර්ණ භාෂාවකින් උපයුක්ත කිරීමයි.කවියකු බොහෝ විට යොදා ගනුයේ එදිනෙදා භාවිත භාෂවයි. එහෙත් ඔහු බලාපොරොත්තු වන ඵලය සුවිශේෂ වේ.

සාපිංගෙ පවුල සිරිපිනා

සැලෝලයිඩ් වළලු දෑත පුරා දමන්නා

බොඩිය පෙනෙන තුනී හැට්ට අදින්නා

උකුළ සලා සිනා සිසී

එහෙං මෙහෙං කිසි බිසි ගා යන්නා

කුරහන් තුනයි වැපුරුවේ අමාරුවේ

කපන්ටත් බැරුව අත පය රුදාවේ

අරින්ටත් බැරුව ලොවගම සින වේ

කපමු නැනේ ඉපනැල්ලේ සුබාවේ

මෙලෙස උපකාර වන භාෂාව ගැමි ජනයාට සමීපවන භාෂවක් විය යුතු ය. එසේ නොවුනොත් සාමාන්‍ය පොදු ජනයාට කවියේ ඇති අරුත් සමීපවීමට ඇති අවස්ථාව ඉතාමත් අවමය.

- උපමා,රූපක හා සංකල්ප රූප

උපමාවක් යනු කිසියම් දෙයක් තවත් දෙයකට සමාන කිරීමයි. එනම් “සේ,එව්,මෙන්,ලෙස....” ආදී නිපාත උපමාවන් ලෙස යොදා ගැනියි.

කළු ගල් පවා වන මල් පෙති මෙන් මුදු වේ

දවසෙක එහෙත් මල් පෙති කළු ගල් බඳු වේ....

උපමාවක් යොදා ගැනීමේ දී එය අවස්ථාවට උචිත ලෙස යෙදිය යුතු ය. එය මනා ලෙස උක්ත කවියේ යෙදී ඇත. උපමාව සංක්ෂිප්ත උවත් එයින් කියා පාන අදහස ඉතාමත් ප්‍රබලය. එසේ නොවූ කල කවියට හා කවියේ රසයට හානියක් සිදු වේ. කෙසේ ද යත්,

සමන්මලීගේ පියයුරු දැක නැවත හැරී

තබන්නෙමි අලුත් වූවමක් කොහොම හරී

පැලෙන්නට ඉතා ලංවුණු සුලං පිරී

ජපන් බැලුම් යුවලක් වැනි නොවෙද සරී

මෙහිදී කවියා උපමා යොදා ගෙන ඇති අයුරට පියයුරු ලොකුවට ඇති බව පවසයි. ඇතැම් යෙදුම් මගින් ධ්වනිත වන්නේ බියකි. අසාර්ථක ලෙස උපමා යොදා ගැනීමේ දි උපමා අර්ථ රසයට හානී පමුණුවයි.

රූපකයේ දි සමාන කිරීමක් නොමැත. උපමවේ මෙන් නිපාත යොදා ගන්නේ ද නැත.

“සැමරුම් වග වලසුන් රෑනට - මා ගොදුරක් වී- ලේ ගලනා ගොදුරක් වී”

උපමාවක් හා රූපකයක් අතර වෙනස මෙයින් මොනවට සූචනය වේ.

ඔයා රෝස මලක් වගේ - ------------------------------------------

ඔයා රෝස මලක් - ------------------------------------------

උපමා හා රූපක යමක් සංක්ෂිප්තව , ප්‍රබල ලෙස කියනු ලබයි. උපමා හා රූපක සැබවින්ම රසවත් උචිත නැවුම් විය යුතු ය. එමෙන්ම මේ හා බැඳී පවතින ප්‍රධාන කාව්‍ය ලක්ෂණයක් ලෙස සංකල්ප රූප හඳුනා ගත හැක. සංකල්ප රූප වූ කලී කවියෙකුගේ අදහස සරසාලීම පිණිස පිහිටි බාහිර අලංකරණයක් නොව, කාව්‍ය චින්තනය සමගව සමානව බැඳී පවතින්නකි.එමෙන්ම පාඨකයාගේ පසිදුර මගින් මනසට පිවිස භාව ප්‍රබෝධයක් ඇතිකිරීමට සමත් වාක් චිත්‍රය චිත්ත රූප නම් වේ. සංකල්ප රූප මගින් කිසියම් සිදුවීමක් හෝ මනෝභාවයක් හෝ විචාර චින්තාවක් උත්කර්ෂවත් ලෙසත්, සංක්ෂිප්ත ලෙසත් සිතුවම් කිරීමට සංකල්ප රූප මහෝපකාරි වේ.

### ❖ සංකේත

සංකේත යනු යම් දෙයක් මගින් තවත් දෙයක් හැඟවීමයි. සංකේතයක් මගින් යමක් සංක්ෂිප්තව දැක්විය හැක. උපමාවක් , රූපයක් නම් අපට හඳුනා ගැනීමට පහසුය. නමුත් සංකේත එසේ නොවේ . එක් අයකු ග්‍රහණය කරගන්නා සංකේතය තවත් කෙනෙකුට වෙනත් අයුරකින් ග්‍රහණය වීමට ඉඩ ඇත. යමෙකුට සංකේත මගින් මවන රසය වටහා ගැනීමට රසිකයා සතුව සංකේතාර්ථ වටහා ගැනීමේ ශාක්‍යතාව තිබිය යුතු ය. එමෙන්ම කවියේ පමණක් නොව වෙනත් කලා නිර්මාණයන්ගේ ද සංකේත දැකිය හැක. සඳකඩ පහනේ අන්තර්ගත නෙළුම් මල මගින් පාරිශුද්ධත්වය සංකේතවත් කරයි. කවි තුළ බහුල මෙම සංකේතාර්ථ අපි මෙසේ හැඳින ගනිමු.

“දවසක්දා

කැඩපත ඉදිරියට ගිහින්

ඇඳි සළු පිළි උනා දමා

හෙළුවැල්ලෙන් බලා උනෙමි

ඈත අතීතේ දිනකදි

අන්ධකාර ගුහාවක්දි

වැද්දකු තව වැද්දකු හට

මූණ ගැසුනා මෙන් විය” - මහගම සේකර

ජීවිතයේ සැබෑ ස්වරූපය ගම්‍ය කිරීමට යොදා ගත් සංකේතාර්ථ උක්ත කවියෙන් ඉදිරිපත් කරයි.

### ❖ ශබ්ද ධ්වනිය

යම් කවියක ශබ්දයකින් මනා අර්ථ රසයක් ලබා දීම ශබ්ද ධ්වනිය ලෙස සරලව හඳුනා ගත හැක. කවියක අර්ථය හා ශබ්දය යන කොටස් දෙකක් දැකිය හැකි ය. නමුත් සාර්ථක කවියක මෙම කොටස් දෙකම එකට බැඳී පවතී. එනම් කවියක ශබ්දය වූ කලී එහි අර්ථයේ දෝංකාරයයි.

නුවන්ත ලියනආරච්චි Artsapi.lk

"ඩෙංකුටු ඩෙංකුටු ඩෙංකුටු ඩෙංකුටු

අන්න නුවර පෙරහැර එනවා.."

"රුල් නොමැති අහස් පොත්

රතු පාටින්

ඉරේ රශ්මි ලියෙවුනු පෙර

මං එනවා හුළු එළියෙන්

ගලින් ගලට පය තිය තිය

ගලින් ගලට පය තිය තිය"

❖ ව්‍යංග්‍යාර්ථය

වචනයේ අර්ථය මගින් කියවෙන අර්ථය නොව ඒ මගින් ඉදිරිපත් කරන සැගවුනු අර්ථය ව්‍යංග්‍යාර්ථය ලෙස සරල හදුනා ගත හැක.

ගොඩැල්ලේ තරම දැන ගෙන ළිඳ කපනු
බොරුල්ලේ තරම දැන ගෙන උඩ පනිනු
කඩුල්ලේ තරම දැන ගෙන කඳ බඳිනු
තමුන්ගේ තරම දැන ගෙන කල් හරිනු

සිංහල ජන කවියට අයත් මෙම කවියේ වචනයෙන් රූපණය වන වචනාර්ථයට එහා ගිය ගැඹුරු අරුතක් ඇත. තමන්ගේ සුදුසුකම හැකියාව මත වැඩ කළ යුතු බව ව්‍යංග්‍ය මගින් විෂද වේ.

- සාහිත්‍ය රස වින්දනයේ දී භාවිත වදන්

✓ පරිකල්පනය - සාහිත්‍ය කලාත්මක නිර්මාණයකට අවශ්‍ය දෑ සිතින් මවා ගැනීම පරිකල්පනය නම් වේ.
✓ අපූර්වත්‍වය(ප්‍රතිභාව) - පෙර නුවූ විරූ නො ඇසූ විරූ නොදුටු විරූ දෑ නිර්මාණය කිරීමේ හැකියාව අපූර්වත්වය නම් වේ.
✓ උත්ප්‍රේක්ෂාලංකාර - අප්‍රාණික වස්තුවක් ප්‍රාණය ගැන්වීම හෝ ස්වභාවික සිදුවන යමක් වෙනත් අයුරකින් ගෙන ඒම මෙලස හඳුන්වයි.
✓ අතිශයෝක්ති අලංකාරය - යම් වස්තුවක හෝ සංසිද්ධියක ස්වභාවය පමණ ඉක්මවා වර්ණනා කිරීම.
✓ සතතාභ්‍යාසය - නිතර නිතර අභ්‍යාසය මෙනමින් හඳුන්වයි. එනම් නිර්මාණයක නිරතුරුව නියලීම වේ.
✓ දෘෂ්ටි කෝණය - යම් අත්දැකීමක් දෙස කවියා හෙලන බැල්ම මෙනම් වේ.
✓ කාව්‍ය අලංකාර - කවියකු තම කවිය අර්ථවත් හා රසවත් කිරීමට යොදා ගන්නා කාව්‍ය අලංකාර මෙනමින් හඳුන්වයි.

# ආකෘතිය

නිර්මාණයක අන්තර්ගත රටාව ආකෘතිය ලෙස සරලව හඳුනාගත හැක. කවියක ආකෘතිය සිව් වැදෑරුම් ය.

- ගී ආකෘතිය
- සිව්පද ආකෘතිය
- දෙපද ආකෘතිය
- නිසඳැස් ආකෘතිය

## ගී ආකෘතිය

ගී ආකෘතිය යනු මාත්‍රා සමාන නොමැති පාද හතරකින් යුත් එළිවැටක් ද විශේෂ නොමැති ආකෘතියයි.

සැරද කිර රද සඳ - නන් වන් රුවන් රුවන්

යහකුරු මියුරු තෙපලෙන් - සව් ලෙව් හදන් හදනා

ගිරා සංදේශයේ එන මෙම කවියේ මාත්‍රා අසමාන ය. පාද හතරකින් ද යුක්තය. මෙය ගී ආකෘතිය මනාව විෂද වන කවියකි.

## සිව්පද ආකෘතිය

පද පේළි හතරකින් යුක්ත එළිවැට සහිත නිර්මාණයන් සිව්පද අකෘතියට අයත් වේ. මෙහි එළිවැට කවියේ කිහිප පළකම තිබිය හැක.

නුබ තල ළහිරු බබළයි උණුසුමා පවන්

බිඟු කැල උරයි වන මල් රොන් රසය නවන්

එහි ලොල නොවී පියඹා ආ ගමන මෙවන්

සමනොල මිතුර නුඹටයි මගෙ ආයුබොවන්

ආනන්ද රාජකරුණා මහතා රචිත මෙම කවිය සිව්පද ආකෘතියට අයත් වේ.

## දෙපද ආකෘතිය

කවිය පාද දෙකකින් සමන්විත නම් එය දෙපද ආකෘතියට අයත් වේ.මෙම ආකෘතිය අදහස් රසවත් ලෙස ප්‍රකාශ කිරීමට උචිත ආකෘතියයි.

සුදට සුදේ මහ ගොඩක් වලාකුළු තරු යට අහසේ දිව යන්නේ

කවුරුද අක්කේ මේවා හදන්නේ කොහේ තිබිලද මේ හැටි එන්නේ

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතා රචිත "ළදරු හැඟුම්" නැමති මෙම පද්‍ය දෙපද ආකෘතියට අයත් වේ.

- නිසඳැස් ආකෘතිය

කවියේ පාද සමාන නොමැති නමුත් යම් රිද්මයක් අන්තර්ගත කවි විශේෂ නිසඳැස් ආකෘතිය නම් වේ.

බුද්ධිය මිත්‍රයෙකැයි සිතූ මම
දිනක් මහ රක සිට
මගේ දෙවියන්
මරා හෙළමි
දැවෙන්තයකු වන බුද්ධිය
අඳුරෙහි මහ අඩි තබමින්
මා පිටිපසින් එනු
මට ඇසෙයි.

" ජී.බී. සේනානායකයන්ගේ දෙවියන් මැරීම" නම් මෙම පැදිය නිසඳැස් ආකෘතියට අනුව රචිත නිර්මාණයකි.

මීට අමතරව නිසඳැස් හා සඳැස් ආකෘතියේ සම්මිශ්‍ර වීම "මිශ්‍ර ආකෘතිය" නම් වේ.

## රස හා භාව

නිර්මාණයක් රස විඳීමේ දි ඇතිවන හැඟීම් භාව නම් වේ. එම හැඟීම් මඟින් ලබන ආස්වාදය රසය නම් වේ.

- ශෘංගාර රසය - රති භාවය

කිසියම් නිර්මාණයක් කියවන විට හෝ අසන විට පංචේන්ද්‍රියයන් මඟින් යම් ආස්වාදයක් ලබයි නම් එහි ඇත්තේ ශෘංගාර රසයකි. එ මඟින් ඇතිවන හැඟීම රති භාවයයි.

පින් පියයුරු බර සසලා බිඳිති සිහිනිඟ කොමළා
මන් බැඳි දිගු නිල් වරලා හෙළා කුසුම් දම් ළකලා
සන් සල නූපුර එකලා වැලපෙයි මහා හඬ ම තළා
සුන්දර මුත්හර උදුලා පහරයි ළැම පෙදෙස බලා (රත්නාවලී නාට්‍ය)

ArtsApi.lk නුවන්ත ප්‍රියදර්ශනී මාවත

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

- **වීර රසය - උත්සාහ භාවය**

යම් නිර්මාණයක වීරවත් ආස්වායක් ලැබේ නම් එය වීර රසයයි. එමඟින් ඇතිවන හැඟීම උත්සාහ භාවයයි.

බලවූ පොලොන්නරු අනුරාපුර පෙදෙස
සිතවූ පැවති නිදහස මෙහි පෙර දවස
නගවූ තව තවත් තරසර තරුණ ගොස
වරෙවූ යමවූ නැගිටිවූ නොනිදවූ මෙලෙස ( එස්.මහින්ද හිමි)

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

- **බීභත්ස රසය - පිළිකුල් භාවය**

කිසියම් නිර්මාණයක් කියවන පාඨකයාගේ සිතට පිළිකුල් ස්වභාවයක් දැනවේ නම් එහි ඇත්තේ බීභත්ස රසයයි. එයින් ඇති වන්නේ පිළිකුල් භාවයයි.

වූරුණු තෙල් හා දාඩියයි ගලන්නේ
කෙළ සොටු මළ මූත්‍රා ද ගැවෙන්නේ
කුණු දූවිලි ද තැවරී තිබෙන්නේ
මේ හැම දෙයින්ම හම පිළිකුල් වන්නේ

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

- **රෞද්‍ර රසය - ක්‍රෝධ භාවය**

නිර්මාණයක් මඟින් දරුණු ස්වභාවයක් අන්තර්ගත වන්නේ නම් එහි ඇත්තේ රෞද්‍ර රසයයි. එමඟින් ජනිතවන හැඟීම ක්‍රෝධ භාවයයි.

මගේ කුකුළා නැසූ එකා
දදය ඔබගෙ පාළු යකා
තව එක බුද දිනක් තකා
ඉන්නට ඉඩ නොදී මකා

### හාස්‍ය රසය - හාස්‍ය භාවය

යම් පද්‍යක හෝ ගද්‍යක සිනාව මුසු වූ ආස්වාදයක් ලබා දේ නම් එහි ඇත්තේ හාස්‍ය රසයයි. එමගින් හාස්‍ය භාවය උපදී.

අම්බලමේ පිනා
වළං කඳක් ගෙනා
ඒක බිඳපි ගොනා
ඒකට මට හිනා

### භයානක රසය - භය භාවය

යම් නිර්මාණයකින් බිය මුසු ස්වරූපයක් ජනිත වන්නේ නම් එහි එත්තේ භයානක රසයයි.එමගින් ඇති වන හැඟීම භය භාවයයි.

සිතුවත් බිය කරවන අර තරයේ
වැටුනොත් එකසිය සතියක් නිරයේ
බලවත් දුක් විදිනය කරදරයේ
මද කුත් පිනකට පින් අවසරයේ (ලෝ වැඩ සඟරාව)

### කරුණ රසය - ශෝකී භාවය

කරුණාව, දයාව මුසු වූ රසයක් ජනිත කිරීම කරුණ රසය නම් වේ. එහී අන්තර්ගත හැඟීම ශෝකී භාවයයි.

පෙම්මා සුරතල් කියමින් දෙතනේ කිරි බොම්මා
වම්මා කඳුළැල් ඉස ඉස ඇවිදින්දැයි අම්මා
අම්මා අප නොදැක ඉතින් කෙලසක වැවෙම්මා
සම්මා සම්බුදු වන දා නිවන් දකින් අම්මා (වෙසතුරුදාකව)

## අද්භූත රසය - විශ්මය භාවය

සාහිත්‍ය නිර්මාණයක් තුළ පුදුමයක් අන්තර්ගත වේ නම් එහි ඇත්තේ අද්භූත රසයයි. එමගින් ජනිත වන්නේ විශ්මය භාවයයි.

අප බෝ සතුන් මිස
අනෙකකු නො ම අසන ලෙස
සුර රජු සිට අහස
තතක් සිඳුව යි කී ය එ විගස

## ශාන්ත රසය - ශම භාවය

යම් නිර්මාණයක නිවුණු ස්වභාවයක් අන්තර්ගත වී නම් එහි ඇත්තේ ශාන්ත රසයයි. එයින් ඇතිවන හැඟීම ශම භාවයයි.

නොයෙක් තැන ම පිපි මල් පිරුණු පොකුණුය
ගෙයක් කන ම සැදැහැන් දෙවන දකුණුය
සුදක් ලෙස තිබෙයි මළු මං හැර කුණුය
සියක් අය කෙරති වැඳ පුද පැදකුණුය (හංස සංදේශය)

## වත්සල රසය - රති භාවය

නිර්මාණයක සෙනහසක් ජනිත වන්නේ නම් එහි ඇත්තේ වත්සල රසයයි. එමගින් ජනිත වන්නේ රති භාවයයි.

ගුරු සිත නො රිදවා
වේලාව නො වරදවා
බැති පෙම් උපදවා
අකුරු උගනිවු කුමරු සොඳවා (කාව්‍යශේකරය)

Artsapi.lk

# සිංහල කවියේ ගමන් මග

❖ **පසුබිම**

Artsapi.lk

- නූතන කාව්‍ය නිර්මාණ
    - **කොළඹ කවියේ ප්‍රථම තරංගය**

      ආනන්ද රාජකරුණා - සමනලයා

      ඇස්. මහින්ද හිමි - ලක් මවුනි මගේ
    - **කොළඹ කවියේ ද්විතීය තරංගය**

      පී. බී. අල්විස් පෙරේරා - පැසුණු පැණ

      සාගර පලන්සූරිය - ඉගිලෙන සිහින

      මීමන ප්‍රේමතිලක - අඩසඳ

      විමලරත්න කුමාරගම - වන්නියේ හැන්දෑව

      එච්. එම්. කුඩලිගම - තවමත් ඔබ මගේ ය

      ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ - ළදරු හැගුම්
    - **හෙළ හවුල් කවිය**

      කුමාරතුංග මුනිදාස - නැළැවිල්ල

      රෑ. තෙන්නකෝන් - හැවිල්ල

      අරීසෙන් අහුබුදු - මගුල් ගීය
    - **නිදහස් කවියේ ප්‍රථම තරංගය**

      ජී. බී. සේනානායක - දෙවියන් මැරීම

      සිරි ගුනසිංහ - අබිනික්මන

      ගුණදාස අමරසේකර - අඳුර අපේ දුක නිවාවි

      මහගම සේකර - මාර යුද්ධය

      විමල් දිසානායක - නාගල කන්ද
    - **නිදහස් කවියේ ද්විතීය තරංගය**

      පරාක්‍රම කොඩිතුවක්කු - දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්

      මොනිකා රුවන්පතිරණ - පොඩි දුව

      දයාසේන ගුණසිංහ - රන්තැටියක කඳුළු

      බුද්ධදාස ගලප්පත්ති - දුරු රට ගිය පුතු

      රත්න ශ්‍රී විජේසිංහ - පරමල්

      නන්දන වීරසිංහ - ආදරණීය පාසල

      ආරියවංශ රණවීර - තුරු සෙනඟ හා තණ පඳුර

      ධර්මසිරි රාජපක්ෂ - නංගීගේ රහසිගත සෙනෙහෙ වීණාව

      ලාල් හෑගොඩ - සතුට

තුවන්ත ලියනආරච්චි
Artsapi.lk